# හාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
# திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
# Department of Treasury Operations

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,මහලේකම් කාර්යාලය, තැ.පෙ.1559, කොළඹ 01, ශ්‍රී ලංකාව.
நிதி திட்டமிடல் அமைச்சு, செயலகம். தபெ. 1559. கொழும்பு 01. இலங்கை
Ministry of Finance & Planning, The Secretariat, P.O.Box: 1559, Colombo 01. Sri Lanka.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 0094112484729, dgto@tod.treasury.gov.lk
ෆැක්ස් / பெக்ஸ் / Fax: 0094 112 484970
පොදු / பொது / General: 0094 112 484500, 0094 112 484600


මගේ අංකය / எனது இல / My No.: TO/REV/M2/07/2010
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2014.12. 31

හාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක: 06 /2014

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

**2014.12.31 දිනට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම**

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 01/2002 හා 2002.07.17 දිනැති චක්‍රලේඛය හා එයට කරන ලද සංශෝධන පිළිබඳව ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02. ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරීන් විසින් මු.රෙ.128(2)(ඇ) විධිවිධාන ප්‍රකාරව තම වගකීම යටතේ පවතින ආදායම් සංකේතාංකවලට අදාලව හය මසකට වරක් හිඟ ආදායම් පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව ඇත. භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ගණන් දීමේ නිලධාරියා ලෙස කටයුතු කරන පහත සඳහන් ආදායම් සංකේතාංක යටතේ එකතු කරන ආදායම් පිළිබඳව අදාල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් /ගණන්දීමේ නිලධාරීන් විසින් හය මසකට වරක් ඉදිරිපත් කරනු ලබන තොරතුරු ඒකාබද්ධ කිරීමෙන් හිඟ ආදායම් වාර්තා සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.

| ආදායම් සංකේතාංකය | විස්තරය |
|---|---|
| 20.02.01.01 | රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - රජයේ ගොඩනැගිලි කුලී |
| 20.02.01.99 | රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - අනෙකුත් කුලී |
| 20.02.02.99 | පොළිය - වෙනත් |
| 20.03.01.00 | විකුණුම් හා ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම |
| 20.03.02.99 | විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු - විවිධ |
| 20.03.03.00 | විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසංතක කිරීම් |
| 20.03.99.00 | විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම් |
| 20.05.99.00 | වර්තන පැවරීම් - ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරීම් |
| 20.06.02.00 | ප්‍රාග්ධන ආදායම් - ප්‍රාග්ධන වත්කම් විකිණීම |

03. එබැවින් ඉහත දැක්වෙන එක් එක් ආදායම් සංකේතාංක යටතේ නියමිත නීති සහ රෙගුලාසි ප්‍රකාරව හඬත්තු කරන ලද ආදායම් සංකේතාංක සඳහා වන හිඟ ආදායම් සම්බන්ධව ගිණුම් වාර්තා පොත් යනාදිය නිසි පරිදි සංසන්දනය කර ඉහත සඳහන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2002 සහ එයට අදාල සංශෝධන පරිදි දක්වා ඇති ආකෘති පත්‍රය TOD/REV/01 අනුව සකස්කරන ලද 2014.12.31 දිනට හිඟ ආදායම් වාර්තා 2015.01.19 දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. අදාළ දිනට හිඟ ආදායම් කිසිවක් නොමැති නම් ඒ බව සඳහන් කරමින් හිස් වාර්තාවක් ඉදිරිපත් කරන්න.

04. තවද එක් එක් වර්ෂයට අදාල හිඟ ආදායමට අනුරූපිව 2014 වර්ෂය තුලදී අයකරන ලද මුදල් පිළිබඳ විස්තර ද එම කාලච්ඡේදය තුලදී මු.රෙ.113 පරිදි භාණ්ඩාගාරයෙන් ලද අනුමැතිය ප්‍රකාරව අතහරින ලද එක් එක් ආදායම් වේ නම් ඒසම්බන්ධ විස්තරද ආකෘති පත්‍ර TOD/REV/02 පරිදි ඉදිරිපත් කළ යුතුවේ.

එම්.එස්.ඩී.රණසිරි
අධ්‍යක්ෂ ජනරාල්,
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව.

පිටපත් : 1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව.


*Additional Director General (Foreign Aid, Public Debt, Admin & Finance)* — Tel : 0094 112 484738, Fax : 0094 112 320042
*Additional Director Generl (Consalidated Fund Mgt, Revenue & Reforms)* — Tel : 0094 112 484748, Fax: 0094 112 484970
*Director (Cash Management)* — Tel: 0094 112484901, Fax: 0094 112 484970
*Director (Consolidated Fund Mgt)* — Tel: 0094 112 484994, Fax: 0094 112 484970
*Director (Revenue)* — Tel: 0094 112484638, Fax: 0094 112 484970
*Director (Foreign Aid Mgt)* — Tel: 0094 112484751, Fax: 0094 112320042
*Director (Debt Mgt)* — Tel: 0094 112484749, Fax: 0094 112320042

# 2014.12.31 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව

(I) ව්‍යවස්ථාව /අධිකාරිය -(අදාල නීති රීති හෝ චක්‍රලේඛ උපදෙස්) .....................................

(II) ව්‍යවස්ථාපිත අධිකාරිය - (අදාල අමාත්‍යංශය/ දෙපාර්තමේන්තුව හෝ ආයතනය) ..............................

(III) ආදායම් අයිතමය- ...............................

(IV) ආදායම් සංකේතාංකය - ..............................

| විස්තරය | හිඟ ආදායම් | | | | | හිඟ සඳහා හේතු | හිඟ අයකර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග | හිඟ අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ සහතිකය |
|---|---|---|---|---|---|---|---|---|
| | 2011.12.31 දින දක්වා සමුච්චිත හිඟ මුදල රු | 2012 වසරට අදාල හිඟ මුදල රු | 2013 වසරට අදාල හිඟ මුදල රු | 2014 වසරට අදාල හිඟ මුදල රු | 2014.12.31 දක්වා මුළු හිඟ මුදල (2 +3 + 4 +5) රු | | | |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

2014.06.30 දිනට ඉදිරිපත්කල හිඟ ආදායම් වාර්තාව මගින් ඉහත වගුවේ තීරු අංක 2 සිට 4 දක්වා වාර්තා කරන ලද එක් එක් හිඟ මුදල් වලින් 2014 වර්ෂය තුලදී ලද අයවීම් ඇතොත් ඒවා අඩු කල පසු ලැබෙන මුදලට මෙම වාර්තාවේ එම තීරු යටතේ වන එකතුන් සමාන විය යුතුවේ. එසේ නැතහොත් අදාල වෙනස්කම් සඳහා විස්තරාත්මක හේතු ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ යුතුය.

දිනය - ................................................

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

.................................

ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්

# 2014.12.31 දිනට හිඟ ආදායම් එකතු කිරීම් පිළිබඳ සහ අනුමත ආදායම් අතහැරීම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :

ආදායම් සංකේතාංක :

| විස්තරය | 2014 වර්ෂය තුල හිඟ ආදායම් එකතු කිරිම | | | | * 2014 අවසාන මාස හය තුල හිඟ ආදායම් අත්හැර දැමීම් | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2011.12.31 දින දක්වා හිඟ මුදලට අනුරූපීව එකතු කිරිම් * රු | 2012 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරිම් * රු | 2013 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරිම් * රු | හිඟ මුදලට අදාලව මුළු එකතු කිරිම් (2+3+4) රු | 2011.12.31 දක්වා | | 2012 | | 2013 | | හිඟ මුදලට අදාලව අත්හැර දැමීම්වල මුළු එකතුව (6+8+10) රු |
| | | | | | හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් රු | මු.රෙ. 113 ප්‍රකාරව අතහැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් රු | මු.රෙ. 113 ප්‍රකාරව අතහැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් රු | මු.රෙ. 113 ප්‍රකාරව අතහැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) | (10) | (11) | (12) |
| | | | | | | | | | | | |

*සංලක්ෂය : එක් එක් ආදායම් සංකේතාංක යටතේ වන යම් කිසි ආදායම් අත්හැර දැමීමක් සඳහා මු.රෙ. 113 ප්‍රකාරව භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ. එබැවින් මෙ යටතේ සඳහන් කල යුත්තේ එසේ භාණ්ඩාගාරයේ (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව) අධිකාර බලය ලබාගත් අතහැර දැමීම වන අතර ඒ සඳහා අදාල එක් එක් බලය දිමේ ලිපියේ පිටපතක් ද මේ සමඟ ඇමිණිය යුතුවේ.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි .

දිනය :- ......................................

......................................

ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්